රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 12/2005 (IV )

මගේ අංකය : EST-7/ INSUR /04/ 1020
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

2013.01.07

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**2005 අයවැයෙන් යෝජිත රාජ්‍ය නිලධාරීන් සඳහා වූ නව රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීම (අග්‍රහාර)**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2005.12.23 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005 (II) හි 05 ඡේදයේ I උප ඡේදය, 2005.05.18 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 12/2005 හි ඇමුණුම 1 හි 1 වන කොටසේ වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ වූ වගන්තියේ අනු අංක 10 ඡේදය සහ II වන කොටස යටතේ IV හි 'ඉ' උප ඡේදය කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. 2013 වසරේ අයවැය යෝජනා අනුව එකී ඡේදයන් හී විධිවිධාන පහත සඳහන් පරිදි සංශෝධනය කෙරේ.

**05. වාරික ගෙවීම**

**I.** රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ සියලුම නිලධාරීන් ද, රාජ්‍ය සේවයෙන් පරිබාහිර සේවයන් සඳහා විධිමත් පරිදි තාවකාලිකව මුදා හැර ඇති නිලධාරීන්ද අග්‍රහාර රක්ෂණ ක්‍රමයට දායක වීම අනිවාර්ය වේ. ඒ සඳහා ඔවුන්ගේ මාසික වැටුපෙන් රු.125/- ක් බැගින් වූ වාරික මුදලක් අය කර එම වාරිකය අග්‍රහාර රක්ෂණ භාර අරමුදල වෙත යැවිය යුතුය.

**ඇමුණුම (I)**

**1 කොටස**

**වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය**

| | ප්‍රතිලාභ වර්ගය | සීමාව |
|---|---|---|
| 10 | I. සාමාජිකයින් සඳහා පමණක් පහත සඳහන් හෘදය ආශ්‍රිත ශල්‍යකර්ම වෙනුවෙන් ප්‍රතිපූර්ණය කිරීම (උපරිමය)<br>1. Heart Attack – (Myocardial Refraction)<br>2. Coronary Artery Disease (Coronary by – pass Surgery)<br>3. Stroke (Cerebra Vascular Accident)<br><br>II. සාමාජිකයින් සඳහා පමණක් පහත සඳහන් ශල්‍යකර්ම සඳහා (උපරිමය)<br>1.Cancer<br>2. Renal Failure<br>3. Major Organ Transplant, such as lung or bone marrow, However this benefit will not be paid to a donor of a major organ.<br>4. Paralysis<br>5. Multiple Sclerosis<br>6. Primary Pulmonary Arterial Hypertension<br>7. Fulminate Hepatitis | රු. 400,000.00<br><br>රු. 150,000.00 |

**II වන කොටස**

**පෞද්ගලික හදිසි අනතුරු සහ ස්වාභාවික මරණ රක්ෂණාවරණය**

IV. ඉ. ස්වාභාවික මරණයක් සඳහා රු. 100,000 /-

03. ඉහත සංශෝධන 2013.01.01 දින සිට ක්‍රියාත්මක වේ.

04. මහා භාණ්ඩාගාරයේ එකඟත්වය ඇතිව මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ.

පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.